# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,391 — 1924ක්වූ මැයි මස 9වෙනි දිනවූ සිකුරාද.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**No. 2,727, C. P.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1924ක්වූ ජූනි මස 20වෙනි දිනවූ සිකුරාද පස්වරු 2ට කනිසමට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩපලාත කෝරළයේ පිහිටාතිබෙන බිම්කැබලි 11ක්.

මූල් සිතියම 6,363   ගම—උඩපලාතේ තැඹිලිගල පල්ලේගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 1 26C | ඉළුක්ගැවේකුඹුර .. | — .. | ආණ්ඩුව (කේ. බබා සහ පී. පුලිහා විසින් අල්ලාගන තිබේ) | කුඹුර .. | 0 0 21·5 | 300* |
| 1333 | එගොඩවත්තේකුඹුර | — .. | ආණ්ඩුව (වී ඩිංගිරි බලාතියනවා අල්ලාගන තිබෙන කැබෙල්ල) | හිස්බිම් ටිකක් ඇති කුඹුර | 0 1 11·75 | 300* |
| 1333A | කම්මල්දෙරකුඹුර නොහොත් මානකුඹුර | — .. | ආණ්ඩුව (වී. ඩිංගිරි සහ සහෝදරයින් අල්ලාගන තිබෙන කැල්ල) | එම .. | 0 0 38·55 | 300* |
| 1333B | එගොඩවත්තේකුඹුර | — .. | ආණ්ඩුව (එච්. උන්ගු අල්ලාගන තිබෙන කැල්ල) | එම .. | 0 0 20·45 | 300* |
| 1333C | කම්මල්දෙරකුඹුර .. | — .. | ආණ්ඩුව (වී. බලතියාහු අල්ලාගන තිබෙන කැල්ල) | එම .. | 0 0 19·85 | 300* |
| 1333D | මානකුඹුර .. | — .. | ආණ්ඩුව, (වී. අන්නාරන්හි අල්ලාගන තිබෙන කැල්ල) | එම .. | 0 0 7·75 | 300* |
| 1333F | නෙසරුව .. | — .. | ආණ්ඩුව (එච්. ගනිතා අල්ලාගන තිබෙන කැල්ල) | එම .. | 0 0 9·95 | 300* |
| 1334 | කම්මල්දෙරකුඹුර නොහොත් මානකුඹුර | — .. | ආණ්ඩුව, වී. ඩින්ගිරි බලිතියනවා සහ සහෝදරයන් අල්ලාගන තිබෙන කැල්ල | එම .. | 0 0 2·89 | 300* |
| 1334A | එම .. | — .. | ආණ්ඩුව (වී. බලිතියාහු සහ එච්. ගනිතා අල්ලාගන තිබෙනකැල්ල) | එම .. | 0 0 3·45 | 300* |
| 1334B | මානකුඹුර .. | — .. | ආණ්ඩුව (වී. අන්නුරන්හි සහ එච්. ගනිතා අල්ලාගනතිබෙන කැල්ල) | එම .. | 0 0 1·46 | 300* |
| 1334C | නෙසරුව .. | — .. | එච්. ගනිතා අල්ලාගන තිබෙනකැල්ල | එම .. | 0 0 0·70 | 300* |

* නැවත විකිනීමට ප්‍රසිද්ධකරනලදී.

මෙම ඉඩම් ගැන වැඩිදුර විස්තර මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1924ක්වූ මැයි මස 5වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සිසිල් ක්ලැමැන්ටි,
මහලේකම්තාරිස් වම්හ.

**No. 2,728, C. P.**—මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1924 ක්වූ ජූලි මස 7 වෙනි දිනවූ සඳුදා උදේ දහයට දීපේගොඩ ගම්සභාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ කොත්මලේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1_ක්.

මුල් සිතියම 7,457. ගම — මැද්දෙගොඩ රංචිගම්මැද්ද.

අයිතිකමකියන්නා—ආණ්ඩුව (ඉල්ලුම්කරු විසින් වැඩිපුර අල්ලාගෙන තිබෙන කොටස.)

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | වැකලාව | .. පුසුල්පිටියේ විහාරේ පදිංචි පී. රතනජෝති උන්නාන්සේ | තේ ඉඩම | .. 3 2 34 | 400* |

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | එම | .. එම | .. .. පතන | .. 4 1 36 | 160 |

මුල් සිතියම 7,589. ගම—මැද්දේගොඩරංචිගම්මැද්ද.

අයිතිකමකියන්නා—ආණ්ඩුව, (නැසීගිය එච්. බාලහාමිගේ උරුමක්කාරයින් විසින් වැඩිපුර අල්ලාගෙන තිබෙන කොටස.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | කළුවැව | .. ආණ්ඩුව | .. .. පතන | .. 1 3 17 | 210 |
| 2 | එම | .. එම | .. .. තේ, එලවළු යනාදිය වවා තිබෙන ඉඩම | 1 1 19 | 410 |
| 3 | එම | .. එම | .. .. කුඹුර .. | .. 1 1 23 | 410 |
| 4 | එම | .. එම | .. .. තේ එලවළු යනාදිය වවා තිබෙන ඉඩම | 0 2 19 | 310 |
| 5 | එම | .. එම | .. .. පතන | .. 1 1 34 | 210 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව, (පුසුල්පිටියේ පදිංචි පී. හින්අප්පුහාමිදේ විසින් වැඩිපුර අල්ලාගෙන තිබෙන කොටස.

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | කළුවැවකුඹුර | .. ආණ්ඩුව | .. .. කුඹුර | .. 0 2 18 | 410 |
| 7 | කළුවැවහේන | .. එම | .. .. වත්ත | .. 0 1 38 | 210 |

මුල් සිතියම 6,922 ගම—තිස්පනේ.

අයිතිකමකියන්නා—ආණ්ඩුව (දිසානායක මුදියන්සෙලාගේ උක්කුබන්ඩාට බඳුදී තිබේ).

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | වංගලහේන | .. ගනේහෙලගෙදර කව්රාල | .. තේ ඉඩම | .. 2 2 39 | 250 |

* බේරීමට.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිපුර කාරණ නුවරඑළියේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1924 ක්වූ මැයි මස 7 වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සිසිල් කලෙමැන්ටි,
මහලේකම් වෙනුවට.

---

**No. 2,729, C. P.**—මධ්‍යම දිසාවේ මහනුවර ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1924 ක්වූ ජූනි මස 24 වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 11.30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩපලාත කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 14ක්.

මුල් සිතියම 7,614. ගම්—උඩපලාතේ ගඟඉහලකෝරළේ මීතලව්ව සහ ගිරඋල්ල යන ගම්. අයිතිකමකියන්නා ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | විලදපතන | .. මීතලව්වේ පදිංචි පික්කාදුර යලූ ගෙදර බසියා | පතන සහ මිටි කැලේ .. | .. 1 3 10 | 100 |

ගම—ගිරඋල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | එම | .. ගිරඋල්ලේ රන්කිරා මහදුරයා | පතන සහ මිටි කැලේ .. | .. 2 3 28 | 150 |
| 3 | විදියපොලවත්ත. | — .. | අවුරුදු 10—25 වයසැති පොල්ගස් ඇති වැසියන්ගේ වත්ත අවුරුදු 30 කොස්ගස්ද, අවුරුදු 35—15 තේ පඳුරුද, පුවක් සහ වෙනත් ගෙඩි ජාති ගස්ද, පොල්අතු සෙවිලිකරපු මැටි ගහපු පැලක්ද තිබේ | 1 2 37 | 300 |

නො. 10යේ කැබලිකරපු ප්ලෑනේ නො. 1කේ ප්‍රථමයෙන් ගත් පිටපත.
ගම—උඩපලාතේ ඉහලකෝරළේ තැඹිලිගල පල්ලේගම.

| | | | | | |
|---|---|---|---|---|---|
| 18G | පතලහේන | .. — | .. හේන්කැලේ .. | .. 0 3 37 | 300 |
| 18J | එම | .. — | .. එම .. | .. 1 0 3 | 300 |
| 18K | එම | .. — | .. කෙසෙල්වත්ත .. | .. 0 2 24 | 300 |
| 18L | එම | .. — | .. හේන්කැලේ .. | .. 0 3 24 | 300 |
| 18M | එම | .. — | .. එම .. | .. 1 1 31 | —* |
| 18V | සඳ අඹ ගහ මූල හේන | — | .. එම .. | .. 2 0 0 | —* |
| 18W | සගහේන | .. — | .. එම .. | .. 5 0 12 | —* |
| 18X | රුක්අත්තනදෙනි යේහේන | — | .. එම .. | .. 2 2 27 | 250 |
| 18Y | එම | .. — | .. එම .. | .. 0 0 3 | 250 |
| 18Z | එම | .. — | .. එම .. | .. 2 0 36 | —* |
| 18AA | එම | .. — | .. එම .. | .. 0 0 12 | 300 |

* තක්සේරුකර තිබීමටයි.

මේ ඉඩම් ගැණ වැඩිපුර විස්තර මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් තුමාගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1924 මැයි මස 7 වෙනි දින කොළඹ
මහ ලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සිසිල් ක්ලෙමැන්ටි,
මහ ලේකම් වෙනුව.

**No. 2,349, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1924ක්වූ ජූනි මස 20වෙනි දිනවූ සිකුරාදා පස්වරු 1ට අනුරාධපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කේ නුවරගම්පලාතේ විලච්චිය සහ කැඳෑකෝරළේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 24ක්.

මුල් සිතියම 665. ගම—විලච්චියකෝරළේ පහමුනේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| අංකය. | ඉඩමේ නම | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල. රු. |
|---|---|---|---|---|---|---|---|
| 2AS | පහමුනේගමකැලේ | කේ. මැනික්රාල | වත්තට සුදුසු හේන | 1 | 0 | 4 | 22 |
| 2AU | තෙල්ලියගමකැලේ | බී. කිරිහාමි | වියට සුදුසු ලඳුකැලේ | 1 | 3 | 12 | 23 |
| 2AV | පහමුනේගමකැලේ | වී, සුද්දහාමි | කැලේ | 1 | 3 | 23 | 22 |
| 2AW | තෙල්ලියගමකැලේ | වී. කොම්බිඑතනි | එම | 1 | 0 | 21 | 22 |

මුල් සිතියම 682. ගම—විලච්චියකෝරළේ සියඹලාගහගම.

| අංකය. | ඉඩමේ නම | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල. රු. |
|---|---|---|---|---|---|---|---|
| 2B | සියඹලාගහගමකැලේ | බී. සිරියා වෙල්දුරයා | වත්තට සුදුසු හේන | 1 | 3 | 37 | 21 |
| 7 | ලබුගලයාය නොහොත් සියඹලාගහගමකැලේ | — | වියට සුදුසු හේන | 4 | 0 | 19 | 24 |
| 7F | සියඹලාගහගමකැලේ | ඒ. හොරතලා | එම | 1 | 1 | 9 | 21 |
| 7G | එම | ටී. සිරියා | එම | 3 | 0 | 12 | 24 |
| 7H | එම | ඩබ්ලිව්. සෙච්චා හිටපු වෙල්දුරයා | එම | 2 | 0 | 3 | 21 |
| 7I | එම | ඇස්. හොරතලා | එම | 3 | 2 | 2 | 24 |
| 18 | පාලු ගන්ගොඩ නොහොත් සියඹලාගහගමකැලේ | — | වියට සුදුසු ලඳුකැලේ | 1 | 3 | 24 | 22 |
| 18A | සියඹලාගහගමකැලේ | පී. සේපාල | එම | 4 | 0 | 5 | 26 |
| 18B | සියඹලාගහගමඉඩම | — | පී. සේපාල සහ තවත් අය විසින් අල්ලාගෙන තිබෙන කුඹුර | 0 | 2 | 20 | 21 |
| 78C | එම | — | ඩබ්ලිව්. සෙච්චා හිටපු වෙල්දුරයා සහ තවත් අය විසින් අල්ලාගෙන තිබෙන කුඹුර | 0 | 0 | 19 | 21 |
| 20 | අඹගහවත්තේ කැලේ නොහොත් සියඹලාගහගමකැලේ | එච්. හපුවා | වියට සුදුසු හේන | 1 | 0 | 21 | 21 |
| 29E | සියඹලාගහගමකැලේ | ඇල්. කලුවා වෙල්දුරයා සහ තවත් කෙනෙක් | එම | 2 | 2 | 31 | 21 |
| 30 | අඹගහවත්තේ හේන නොහොත් සියඹලාගහගමකැලේ | — | එම | 0 | 2 | 31 | 21 |

මුල් සිතියම 599. ගම—කැඳෑකෝරළේ පිහෝගම.

| අංකය. | ඉඩමේ නම | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල. රු. |
|---|---|---|---|---|---|---|---|
| 1A10 | පිහෝගමකැලේ | ඇම්. එච්. කපුවා | වියට සුදුසු ලඳුකැලේ | 0 | 0 | 14 | 23 |
| 2H | වාන්ඇලමු කලාන නොහොත් පිහෝගමකැලේ | එම | වියට සුදුසු කැලේ | 0 | 3 | 20 | 25 |
| 2I | එම | එම | එම | 1 | 1 | 8 | 25 |
| 2J | එම | එම | වියට සුදුසු හේන | 0 | 3 | 13 | 22 |
| 7B2 | පිහෝගමකැලේ | එම | වියට සුදුසු ලඳුකැලේ | 0 | 0 | 14 | 23 |
| 1I1 | එම | පී. අමන්ගිලියා | වත්තට සුදුසු හේන | 1 | 0 | 20 | 22 |
| 2K | වාන්ඇල මුකලාන නොහොත් පිහෝගමකැලේ | කේ. පී. විදානේ වෙල්පෙඩියා | වියට සුදුසු කැලේ | 2 | 0 | 12 | 23 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1924ක්වූ මැයි මස 2වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සිසිල් ක්ලෙමන්ටි,
මහලේකම්තාරිස් වම්සා.

---

**No. 2,350, N.C. P.** උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1924ක්වූ ජූනි මස 24වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට අනුරාධපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කේ නුවරගම් පලාතේ විලච්චියකෝරළේ පිහිටා තිබෙනබිම්කැබලි 23ක්.

අන්තිම සිතියම 659. ගම—අඹම්පනේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 14H | ආවිරියාගමලන්ද නොහොත් පළුගහඉඩම | පී. අප්පුරාල වෙල්විදානේ | හේන | 9 | 0 | 23 | 26 |
| 14K | එම | සෙල්ලවන්නිහාමි හිටපු වෙල්විදානේ | එම | 4 | 0 | 5 | 28 |
| 14E1 | පළුගහහේන්යාය නොහොත් ලබුගමකැලේ | ඇන්. මුදලිහාමි සහ තවත් කෙනෙක් | එම | 2 | 0 | 19 | 26 |
| 14E2 | පළුගහහේන්යාය නොහොත් කුඹුක්ගහඉඩම | ආර්. ඒ. ඇල්. සිරිබන්ඩා | එම | 4 | 0 | 7 | 26 |
| 14E4 | එම | — | එම | 0 | 1 | 7 | 26* |
| 14S | කෝන්ගහ ඉඩම නොහොත් අඹම්පනේ කැලේ | බී. ඩිංගිරිබන්ඩා | වත්තට සුදුසු ලඳු කැලේ | 3 | 3 | 4 | 31 |

අන්තිම සිතියම 663. ගම—දන්දරවැව

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1Y2 | ගොමදියගලලන්ද නොහොත් ඇහැටුගහඉඩම | ධම්මජෝති ස්ථවිර | කැලේ | 6 | 0 | 18 | 26 |
| 1Y4 | අන්දරවැවකැලේ | ඩබ්ලිව්. ලෝරෙන්සු පුල්ලේ | එම | 3 | 0 | 1 | 22 |

අන්තිම සිතියම 730. ගම—අලියාවිද්දවැව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 18E | සියඹලාගහ ඉඩම නොහොත් අලියාවිද්දවැවකැලේ | ඇන්. බන්ඩා වෙල් විදානේ .. | කොටසක් එළිකර තිබෙන බිම | 3 3 33 | 40 |

අන්තිම සිතියම 733 ගම—සිවලාපිටිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 35B | වෙල්කටුව .. | ඒ. බංඩා වෙල් විදානේ .. .. | හේන .. | 1 3 28 | 21 |
| 35C | එම .. | ඒ. පුන්චිරාල .. .. | එම .. | 2 0 18 | 21 |
| 33C | සිවලාපිටියකැලේ .. | ඈම්. තේවහාමි .. .. | එම .. | 1 3 8 | 21 |
| 31A | එම . | ඈම්. චන්සිහාමි .. .. | එම .. | 1 3 37 | 22 |
| 31B | එම .. | එම .. .. | එම .. | 3 0 18 | 22 |
| 31C | එම .. | එම .. .. | එම .. | 1 0 8 | 22 |
| 33D | එම .. | ඈම්. බද්දරාල .. .. | එම .. | 3 0 3 | 22 |
| 33E | එම .. | ඒ. උක්කුබංඩා .. .. | එම .. | 2 3 30 | 22 |

අන්තිම සිතියම 734. ගම—දුනුම්බලෑව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 4C | ගකුරුපිටිය .. | වීරසොලේ වී වී බද්දරාල සහ ලේකම | එම .. | 1 0 2 | 20 |
| 4D | දුනුම්බලෑවකැලේ .. | ඇන්. රතීඑතනි .. .. | එම .. | 3 3 26 | 21 |
| 4F | එම .. | ඒ. රතීඑතනි .. .. | එම .. | 2 0 5 | 21 |
| 6 | වලහේන නොහොත් දුනුම්බලෑව කැලේ | බී. ඈම්. අප්පුහාමි .. .. | එම .. | 1 1 25 | 21 |
| 8J | දුනුම්බලෑවකැලේ .. | එම .. | එම .. | 1 0 9 | 20 |
| 8L | එම .. | —* .. .. | එම .. | 0 1 12 | 20 |

* ජේ. අනුමැතිරාල විසින් අල්ලාගෙන තිබෙන අවුරුදු 1කේ සිට 5 දක්වා වයස ඇති පොල්පැල 18ක් සහ තල්ගස් 4ක් තිබෙන හේන.

මේ ඉඩම් සම්බන්ධව වැඩිදුර කාරණා උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1924ක්වූ මැයි මස 6වෙනි දින කොළඹ
මහලේකම්තාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සිසිල් ක්ලෑමැන්ටි,
මහලේකම්තාරීස් වෙනුව.

---

**No. 1,128, P. of S.**—සබරගොමුව දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කුවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන් වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1924ක්වූ ජූලි මස 24වෙනි දිනවූ බෘහස්පතින්දා පෙරවරු 11ට කෑගල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. සබරගොමුව දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කුවේ ගල්බඩකෝරළේ බෙලිගල් කොරළේ කොටසවල පිහිටා තිබෙන බිම්කැබලි 15ක්.

මුල් සිතියමේ නො. 3,297. ගම—දිවෙල. අසිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කෝවිලගාවා හේන, ගොකොටු රුප්පේ හේන, කනවෙසියාගොල හේන, මල්බුළුවගාවා හේන, ඕයෝගලපිට කන්දේ හේන, සහ පිටකන්දේහේන, දූනට දී වෙලවත්ත යන බිම්කට්ටිය | දිවෙල කෑගල්ල රබර් කොම්පැනිය | අවුරුදු 3 සිට 4ජේ වයසඇති රබර් .. | 25 3 23 |

මුල් සිතියමේ නො. 3 261. ගම—සිව්වෑගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඇටිකෙහේල්වරාවේහේන, මාවතතහේන කිරිපල්කඩහේන, මූනමල්දෙල හේන, මෝරන්ගහමූල හේන, කැන්දගොල්ලේ හේන සහ ඇත්ගාලේඅළුත්වතතහේන | කැන්දව තේ සහ රබර් කොම්පැනිය | තේ, අවුරුදු 6යේ සිට 7 දක්වා රබර් සමග වවා තිබෙන බිම්කට්ටිය | 114 1 34 |
| 2 | ඇටිකෙහෙල්වරාවේහේන .. | එම .. | එම පාරට වෙන්කර තිබෙන බිම්කට්ටිය. | 0 0 16 |

මුල් සිතියමේ නො. 3,263. ගම—කැන්දව සහ තුන්බාගේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වැලිපිටියේකුඹුරගාවහේන .. | කැන්දව තේ සහ රබර් කොම්පැනිය | තේ අවුරුදු 5යේ සිට 7 දක්වා රබර් සමග වවා තිබෙන ඉඩම | 5 1 30 |
| 2 | ලීනියගස්තැන්නේහේන සහ වැලිපිටියේ හේන | එම .. | එම .. .. | 6 1 3 |
| 3 | මුත්තෙට්ටුහේන .. .. | එම .. | එම .. .. | 12 0 24 |
| 4 | ගොඩකුඹුරේගාවහේන සහ ගල්හේන .. | එම .. | එම .. .. | 12 3 11 |
| 5 | වැල්ලබොඩහේන .. .. | එම .. | එම .. .. | 2 3 11 |
| 6 | එම .. .. | එම .. | තේ අවුරුදු 5යේ සිට 7 දක්වා රබර් සමග වවා තිබෙන ඉඩම ටිවිගහබයට වෙන්කර තිබෙන බිම්කට්ටිය | 0 3 5 |
| 7 | එම .. .. | එම .. | එම දඹගහඇලට වෙන්කර තිබෙන බිම්කට්ටිය | 0 1 20 |
| 8 | එම .. .. | එම .. | එම එම .. | 0 1 39 |
| 9 | පුස්සමුලහේන .. .. | එම .. | එම .. .. | 1 2 36 |
| 10 | එම .. .. | එම .. | එම ටිවිගහබයට වෙන්කර තිබෙන බිම්කෑල්ල | 1 1 8 |
| 11 | එම .. .. | එම .. | තේ අවුරුදු 5සක වයස රබර් සමග වවා තිබෙන ඉඩම | 0 0 38 |
| 12 | එම .. .. | එම .. | එම ටිවිගහබයට වෙන්කර තිබෙන බිම්කට්ටිය | 0 3 8 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණා කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ ප්ලෑන් කඩදාසි සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැක.

වර්ෂ 1924ක්වූ මැයි මස 2වෙනි දින කොළඹ
මහලේකම්තාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සිසිල් ක්ලෑමැන්ටි,
මහලේකම්තාරීස් වෙනුව.

**No. 1,129, P. of S.**—සබරගමු දිසාවේ රත්නපුරේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1924ක්වූ ජූනි මස 24වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1·30ට රත්නපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 11ක්.

මුල් සිතියම 3,345. ගම—බෝපිටිය කුකුලුකෝරළේ. අයිතිකමකියන්නා—පී. බී. මුත්තෙට්ටුවේගම රංචි මහත්මයා.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | දික්ගොඩැල්ලහේන .. | — .. .. | ලන්ද .. .. | 0 2 0 | — |
| 2 | එම .. | — .. .. | එම .. .. | 1 0 4 | — |
| | මුල් සිතියම 3,325. ගම—අලුත්නුවර කඩවතකෝරළේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | |
| 1 | වලව්වත්තෙහේන .. | වී. යසෝහාමි .. .. | ලන්ද .. .. | 1 3 33 | 35 |
| 2 | හක්කාරසිඟැකුඹුර .. | නොම්මර 72,388 සිතියමට අයිති බිම් කට්ටියේ උරුමක්කාරයෝ විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | කුඹුර .. .. | 0 0 36 | 160 |
| 3 | ගැටපනාගෙදර වත්ත | වයි. රත්තරන්හාමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | අවුරුදු 25 සිට 30 දක්වා පොල් තිබෙන ඉඩම | 0 3 15 | — |
| 4 | එම .. | වයි. පින්හාමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | එම .. .. | 0 2 18 | — |
| | මුල් සිතියම 3,353. ගම—ඉහලනලගම කඩවතකෝරළේ. | | | | |
| 14 | පිට්ටලෙලුඅරවෙපාබොඩ ලන්ද | ඇල්. එලදහාමි .. | කුඹුර .. .. | 0 2 15 | 25 |
| 15 | එම .. | — .. .. | ලන්ද පිට්ටල්ලෙඅරවෙබය ආරක්‍ෂක බිම්කැබෙල්ල (විකුනනුනොලැබේ) | 0 1 22 | — |
| | මුල් සිතියම 3,342. ගම—දිගදුරේ මැදකෝරළේ. | | | | |
| 1 | පුරන .. | ඇම්. හරමානිස් ප්‍රනාන්දු .. | කුඹුර .. .. | 0 1 34 | 15 |
| | මුල් සිතියම 3,346. ගම—හිදැල්ලන කුරුවිටිකෝරළේ. | | | | |
| 1 | දිගොල්ලනදෙහිය .. | ඞී. ජේ. ඒ. සමරවී සහ තවත් අයෙක් | දෙහිය .. .. | 1 3 9 | 36 |
| 2 | එම .. | — .. .. | දෙහිය ගම්සභාපාර ආරක්‍ෂක බිම්කැබෙල්ල (විකුනනුනොලැබේ) | 0 0 21 | — |
| | මුල් සිතියම 3,352. ගම—පන්සිල අටකලන්කෝරළේ. | | | | |
| 1 | පන්විල .. | එච්. වී. හරමානිස් අප්පුහාමි .. | කුඹුර .. .. | 1 0 13 | 56 |
| 2 | එම .. | — .. .. | කැලෑව ගම්සභාපාර ආරක්‍ෂක බිම්කැබෙල්ල (විකුනනුනොලැබේ) | 0 0 23 | — |
| | මුල් සිතියම 3,313. ගම—බෝවත්ත මැදකෝරළේ. | | | | |
| 1 | වැවේකුඹුර .. | පී. ඞී. ඞීන්ගිරියා .. | කුඹුර .. .. | 1 0 6 | 31 |
| 2 | වැවේකුඹුරෙහේන .. | — .. .. | ලන්ද වැවආරක්‍ෂක බිම්කැබෙල්ල (විකුනනුනොලැබේ) | 0 0 5 | — |

නොම්මර 3 353 සිතියමේ නොම්මර 14 බිම්කැබෙල්ලද, නොම්මර 3,342 සිතියමේ නොම්මර 1 දරන බිම්කැබෙල්ලද නොම්මර 3,346 සිතියමේ නොම්මර 1 දරන බිම්කැබෙල්ලද, නොම්මර 3,352 සිතියමේ නොම්මර 1 දරන බිම්කැබෙල්ලද, සහ නොම්මර 3,313 සිතියමේ නොම්මර 1 දරන බිම්කැබෙල්ලද, ඒවායේ ඉල්ලුම්කරුවන් විසින් ආණ්ඩුවේ අවසර පත්‍ර පිට අස්වද්දා තිබෙන බැවින් ඒවා තක්සේරු මිලට ඔවුන්ටම විකුනනු ලැබේ.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කරුණු රත්නපුරේ ආණ්ඩුවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1924ක්වූ මැයි මස 7වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සිසිල් ක්ලෑමන්ටී,
මහලේකම් වමිහ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—නොම්මර $71\frac{1}{4}$ සැතැප්ම කනුව සවිපයේ නැගෙනහිර පැත්තෙන් මහමෝදර පාළමට ලඟාවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 10,526. ගම—ගාල්ලේ නාගරික තුළ මහමෝදර. අන්දම—වත්ත.

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|
| 1 | මීගහවත්ත .. | (1) ඞී. සී. ඒ. ගුණවර්ධන මුදලිතුමාගේ පුත්‍රවූ තර්ස්ටන් අමරසිරි ගුණවර්ධන බුදලේ අද්මිනිස්ත්‍රාර්තැන සහ ඇතිකුත් මෙහි පහත සඳහන් උරුමක්කාරයෝ, (2) ඈන්සන් අමරසිරි ගුණවර්ධන, (3) ජේන් විජේනායක ලමාතැනී, (4) ඇල්ජිනා වීරසූරිය ලමාතැනී, (5) නැසීගිය ඇලිස් ගුණවර්ධන ලමාතැනියගේ ළමයි වන (1) එම වික්ටර් ඇල්බට් කුරුප්පු ගුනතිලක හපුතලේ, (2) කළුතර පදිංචි ඩොනල්ඩ් ජෝන් කුරුප්පු ගුනතිලක පෙරකදෝරු මහතා, (3) එම ප්‍රැන්ක් ඇඩ්ගර් කුරුප්පු ගුනතිලක, (4) එම ලයනල් ඔස්කර් කුරුප්පු ගුනතිලක පෙරකදෝරු මහතා, (5) එම පර්සි හර්බට් කුරුප්පු ගුනතිලක බැරිස්ටර් උන්නාන්සේ, (6) එම ලිලි කුරුප්පු ගුනතිලක තරුණ නෝනාමහත්මී, (7) පාමන්කඩ පදිංචි ඇලන් කවිරත්න ලමාතැනී, (8) කිතුල්ගල පදිංචි රීන් වික්‍රමසිංහ ලමාතැනී, (9) අයිරීස් වික්‍රමසිංහ, (10) සිබල් වික්‍රමසිංහ | 0 0 9·56 |
| 2 | එම .. | එම .. .. .. .. | 0 0 6·25 |

එබැවින් ඉඩම අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1924ක්වූ ජූනි මස 2වෙනි දින පස්වරු 2ටක් කඩිනමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1924ක්වූ මැයි මස 1වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

වී. සී. රහල්,
දකුණු දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වර්මහ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—කක්කුස්සියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 12,489. ගම—දකුනු දෙවුන්දර සනීපාරක්‍ෂක සමිතිය තුළ පිහිටි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ලූනුවත්ත (නො. 626 දරණ ඉඩමෙන් කොටසක්) | පොල් වගාව | මාතර දෙස්තර වී. බී. ගුනරත්න මහතා | 0 0 6·25 |

එබැවින් ඉඩම අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1924ක්වූ මැයි මස 31වෙනි දිහ පෙරවරු 10යේ කඩිනමට මාතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1924ක්වූ අප්‍රේල් මස 29වෙනි දින මාතර කච්චේරියේදීය.

ජී. ඇස්. වුඩ්මෑන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්මහ.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

[කොළඹ දැන්වීම නො. 8,594.]

වර්ෂ 1924ක්වූ මැයි මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903වෙනි ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට, පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹකන්තෝරුවේදී ඇල්. ඇල්. හන්ටර් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇල්. ඇල්. හන්ටර්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කිරීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කිරීම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කේ බස්නාහිර සියනෑකෝරලේ අදිකාරිපත්තුවේ එබේරමුල්ල යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, ඒනම්:—

මූල් සිතියම 16,145.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 2 | දෙල්ගහවත්ත | 0 0 17·50 |
| 3 | එම | 0 0 25·62 |
| | | 0 1 3·12 |

මීට මායිම්—උතුරට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද, එච්. සිඤෝ බබානිස් ප්‍රනාන්දු විසින් අයිතිවාසිකම්කියන දෙල්ගහවත්තද; නැගෙනහිරට එච්. සිඤෝ බබානිස් ප්‍රනාන්දු විසින් අයිතිවාසිකම්කියන දෙල්ගහවත්තද, ඇන්. සිමන් ප්‍රනාන්දු විසින් අයිතිවාසිකම්කියන දෙල්ගහවත්තද; දකුණට සහ බස්නාහිරට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 531වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කොළඹ මි. ම. 26—1924.]

---

[කොළඹ දැන්වීම නො. 8,595.]

වර්ෂ 1924ක්වූ මැයි මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897වෙනි, 1899යේ, 1900යේ සහ 1903වෙනි ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට, පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇල්. ඇල්. හන්ටර් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්නට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇල්. ඇල්. හන්ටර්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කේ බස්නාහිර සීනැකෝරලේ අදිකාරිපත්තුවේ වනවහල යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන මෙහි පහත දක්වන බිම්කැබෙලි, එනම් :—

I.—මුල් සිතියම 16,158.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 7 | වැටකියගහකුඹුර .. .. .. .. .. | 0 0 8·12 |

මීට මායිම්—උතුරට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරන්ට තිබෙන දුම්රියට ඉතුරු කර තිබෙන බිම්කට්ටියද; නැගෙනහිරට පන්තියගෙදවගේ එලාරිස් සහ තවත් අයෙක් විසින් අයිතිවාසිකම්කියන වැටකියගහකුඹුරද; දකුණට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරන්ට තිබෙන වැටකියගහකුඹුරද; බස්නාහිරට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරන්ට තිබෙන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද.

II —මුල් සිතියම 16,158

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 27 .. | කැලේකුඹුර .. .. .. .. | 0 1 10·75 |

මීට මායිම්—උතුරට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරන්ට තිබෙන දුම්රියට ඉතුරු කර තිබෙන බිම්කට්ටියද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරන්ට තිබෙන කැලේකුඹුරේ පිල්ලැවද; නැගෙණහිරට අයි. සිනෝරිස් ප්‍රනාන්දු සහ තවත් අයවල් විසින් අයිතිවාසිකම්කියන කැලේකුඹුරද; දකුණට අයි. සිනෝරිස් ප්‍රනාන්දු සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන කැලේකුඹුරද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරන්ට තිබෙන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද; බස්නාහිරට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරන්ට තිබෙන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 531—532වෙනි පිටුවල ප්ලෑන් බලනු

[කොළඹ මි. ම. 27—1924.]

---

[කොළඹ දැන්වීම නො. 8,596.]

වර්ෂ 1924ක්වූ මැයි මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම්අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන් නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇල්. ඇල්. හන්ටර් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇල්. ඇල්. හන්ටර්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කේ දකුණු අලුත්කුරුකෝරලේ රයිගම්පත්තුවේ රයිගම යන ගම පිහිටාතිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

I.—මුල් සිතියම 16,139.

| බිම්කට්ටිය. | ඉඩමේ නම | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 2 .. | දියගලවත්ත (වැඩිපුර අල්ලා තිබේ) .. .. .. | 1 0 10·37 |

මීට මායිම්—උතුරට එවිස් බුවුන් සහ සමාගම විසින් අයිතිවාසිකම්කියන දියගලවත්තද, වල්පොල යන ගමේ ගම් ඉමද; නැගෙණහිරට වල්පොල යන ගමේ ගම්ඉමද; දකුණට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද; බස්නාහිරට එවිස් බුවුන් සහ සමාගම විසින් අයිතිවාසිකම්කියන දියගලවත්තද.

II.—මුල් සිතියම 16,139.

| බිම්කට්ටිය | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 9 .. | මාරගහවත්ත (වැඩිපුර අල්ලා තිබේ) .. .. .. | 0 1 19·87 |

මීට මායිම්—උතුරට ආර්. පෙද්‍රික් දියස් සහ තව අයවල් විසින් අයිතිවාසිකම්කියන මාරගහවත්තද, ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන මාරගහවත්තද (වැඩිපුර අල්ලා තිබේ), ආර්. පෙද්‍රික් දියස් සහ තවත් අයවල් විසින් අයිතිවාසිකම්කියන මාරගහවත්තද; නැගෙණහිරට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන පුවක්ගහදෙනියද, ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද; දකුණට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද; බස්නාහිරට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන රේල්පාරට ඉතුරුකර තිබෙන බිම, ආණ්ඩුව විසින් බදුදී තිබෙන මාරගහවත්තද (වැඩිපුර අල්ලාගන තිබෙන බිම්කට්ටිය).

III.—මුල් සිතියම 16,139.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|
| 25 .. | මාකෝලියාකුඹුර | (වැඩිපුර අල්ලා තිබේ) .. .. | 0 0 1·37 |
| 26 .. | කුඩාපොල්පිටිය | (එම) .. .. .. | 0 0 7 |
| 27 .. | එම | .. .. .. .. | 0 0 5·37 |
| 28 .. | එම | (වැඩිපුර අල්ලා තිබේ) .. | 0 0 7·62 |
| 29 .. | එම | (එම) .. .. .. | 0 0 1·25 |
| 30 .. | එම | (එම) .. .. .. | 0 0 1·43 |
| | | | 0 0 24·04 |

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 533—535වෙනි පිටුවල ප්ලෑන් බලනු.

මීට මායිම්—උතුරට ආණ්ඩුවෙන් බදුදී තිබෙන මාකෝලියකුඹුර (වැඩිපුර අල්ලා තිබේ); නැගෙණහිරට ඒ. පේදුරු පෙරේරා විසින් අයිතිවාසිකම්කියන මාකෝලියකුඹුරද, ජේ. ජී. පී. ඒ. සිරිවර්ධන විසින් අයිතිවාසිකම්කියන කුඩාපොල්පිටියද, ප්‍රසිද්ධ වැඩදෙපාර්තමේන්තුව විසින් අයිතිවාසිකම්කියන කුඩාපොල්පිටියද. ජේ. ජී. පී. ඒ. සිරිවර්ධන විසින් අයිතිවාසිකම්කියන කුඩාපොල්පිටියද; දකුණට රාගම සිට ජයලට යන පාරද; බස්නාහිරට කරත්තපාරද.

IV.—මූල් සිතියම 16,139.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | | | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 31 | .. | පොල්පිටියේවත්ත (වැඩිපුර අල්ලා තිබේ) | .. | .. | 0 0 3·75 |

මීට මායිම්—උතුරට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද; නැගෙනහිරට ජෝන් ඇෆ්ජ්. පෙරේරා විසින් අයිතිවාසිකම්කියන පොල්පිටියේවත්තද; දකුණට සහ බස්නාහිරට ලංකාණ්ඩුවේ දුම්රිය දුම්රිය විසින් අයිතිවාසිකම්කියන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද.

V.—මූල් සිතියම 16,139.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | | | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 35 | .. | ගුරුනයාකුඹුර (වැඩිපුර අල්ලා තිබේ) | .. | .. | 0 0 0·25 |

මීට මායිම්—උතුරට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන හකුරුකුඹුරද; නැගෙණහිරට ජෝන් ඇෆ්ජ්. පී. ඒ. සිරිවර්ධන විසින් අයිතිවාසිකම්කියන ගුරුනයාකුඹුරද; දකුණට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද; බස්නාහිරට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද.

VI.—මූල් සිතියම 16,139.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | | | | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|
| 49 | .. | කිරිපොලගහවත්ත | .. | .. | .. | 0 0 39·75 |

මීට මායිම්—උතුරට ඒ. යුජීනිය සිල්වා විසින් අයිතිවාසිකම්කියන කිරිපලගහවත්තද, ආණ්ඩුව විසින් බදුදී තිබෙන කිරිපලගහවත්තද (වැඩිපුර අල්ලා තිබේ); නැගෙණහිරට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද; දකුණට ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන දුම්රියට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද, ලංකාණ්ඩුවේ දුම්රිය විසින් අයිතිවාසිකම්කියන පොල්කොටුව නොහොත් කිරිපලගහවත්තද, ආණ්ඩුව විසින් බදුදී තිබෙන කිරිපලගහවත්තද (වැඩිපුර අල්ලා තිබේ); බස්නාහිරට ඒ. යුජීනිය සිල්වා විසින් අයිතිවාසිකම්කියන කිරිපලගහවත්තද.

[කොළඹ වි. ම. 28—1924.]

---

[ගාල්ල දැන්වීම නො. 8,597.]

වර්ෂ 1924ක්වූ මැයි මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවල් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී පී. ජේ. හඩ්සන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණබව මෙයින් දැනගත යුතුයි.

පී. ජේ. හඩ්සන්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනුලැබේ.

ඉඩම්වල තොරතුරු.

දකුණු දිසාවේ ගාලු දිස්ත්‍රික්කේ බෙන්තරවලල්ලාවිටිකෝරලේ කඳිරන්දෙල යන ගම පිහිටාතිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—ලංකාමැනීමේ මූල් සිතියම 584.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | | | | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|
| 2 | .. | ගල්වෙලේකැබෙල්ලඹිවිට (ඇලට ඉතුරුකර තිබෙන බිම) | | .. | .. | 0 1 5 |
| 4 | .. | උඩුවිලඇලෙන් කොටසක් | .. | .. | .. | 1 1 36 |
| | | | | | | 1 3 1 |

මීට මායිම්—උතුරට ඊගල යන ගමේ ගම්ඉමද, උඩුවිලඇලෙන් කොටසක්ද, (පැලැන්දගොඩ යන ගමේ ගම්ඉමද); නැගෙණහිරට උඩුවිලඇලෙන් කොටසක්ද, (වල්ලඹගල සහ පිටුවල යන ගම්වල ගම්ඉම්ද); දකුණට කාරියවසම්පතිරනගේ දෙන් අන්දිරිස් සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන පොතුවිලකුඹුරද; බස්නාහිරට කාරියවසම්පතිරනගේ දෙන් අන්දිරිස් සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන පොතුවිලකුඹුරද, කාරියවසම්වර්ණියගොඩගේ අන්දිරිස් සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන උඩුවිලවත්තද, දෙලලහ පැලවැටකෙයියාවේකුඹුරුයායද, (ප්‍රවෙනි) රජසන්තක උල්ගලඳුවෙ (ඇලට ඉතුරුකර තිබෙන බිම), 238,002 පිඹුරුකඩදාසියේ පෙනීයන ඉඩමද, 204,219 පිඹුරුකඩදාසියේ පෙනීයන ඉඩමද, රජසන්තක ගල්වලේවත්තද, 204,219 පිඹුරුකඩදාසියේ පෙනීයන ඉඩමද, 238,001 පිඹුරුකඩදාසියේ පෙනීයන ඉඩමද.

II.—ලංකාමැනීමේ මූල් සිතියම 584.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | | | | | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|---|
| 8 | .. | අඹිපාර | .. | .. | .. | .. | 0 0 13 |

මීට මායිම්—උතුරට ඊගල යන ගමේ ගම්ඉමද; නැගෙණහිරට දෙලලහ පැලවැටකෙයියාවේකුඹුරුයාය (පරවෙණි), 154,321 පිඹුරුකඩදාසියේ පෙනීයන ඉඩම, කිතුල්ගොඩගමගේ අංදෙහාමි සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන දෙලලහමහවත්තද; දකුණට 154,321 පිඹුරුකඩදාසියේ පෙනීයන ඉඩමද, රජසන්තක පොල්හේනද (ගම්සභාපාරට ඉතුරුකර තිබෙන බිම), කුඩාගල යන ගමේ ගම්ඉමද; බස්නාහිරට ඊගල යන ගමේ ගම්ඉමද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 536—538වෙනි පිටුවල ප්ලෑන් බලනු.

III.—ලංකාමැනීමේ මුල් සිතියම 584.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 12½ | නාරවැල්කැටියේමනාන | 0 0 31 |
| 19 | මාරගහවත්ත | 0 0 22 |
| 20 | නාරවැල්කැටියේමනාන නොහොත් මාරගහකැලේ (පාරට ඉතුරුකර තිබෙන බිම) | 0 0 10 |
| 21 | නාරවැල්කැටියේමනාන නොහොත් මොරගහකැලේ | 0 2 8 |
| | | 0 3 31 |

මීට මායිම්—උතුරට කාරියවසම්වර්තියගොඩගේ දෙන් ඇන්දිරිස් සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන මාරගහවත්ත සහ පලුවත්තද; නැගෙණහිරට 148,431, 154,322 පිඹුරුකඩදාසිවල පෙනියන ඉඩම්ද; දකුණට පිටුවල යන ගමේ ගම්ඉමද; බස්නාහිරට රජසන්තක බෝගහවත්තද.

IV.—ලංකාමැනීමේ මුල් සිතියම 584.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 10½ | දෙලලගමහවත්ත (පාරට ඉතුරුකර තිබෙන බිම) | 0 0 6 |
| 25 | නාරවැල්කැටියේකුඹුරඅද්දරමානාන | 0 3 34 |
| 28 | ගම්සභාපාරෙන් කොටසක් | 0 1 4 |
| 29 | නාරවල්කැටියේකුඹුරඅද්දරමනාන (ගම්සභාපාරට ඉතුරුකර තිබෙන බිම) | 0 1 19 |
| 30 | නාරවැල්කැටියේකුඹුරඅද්දරමනාන | 0 1 38 |
| 31 | නාරවැල්කැටියේකුඹුරඅද්දරමනාන නොහොත් දෙලලගමනාන | 0 1 35 |
| 33 | නාරවැල්කැටියේකුඹුරඅද්දරමනාන | 0 2 23 |
| 36 | ගම්සභාපාර (ඉඩමෙන් ගලාබසින ඇල අත්හැරයි) | 0 0 11 |
| | | 3 1 10 |

මීට මායිම්—උතුරට ඊගල යන ගමේ ගම්ඉමද, රජසන්තක පොල්හේනද, (ගම්සභාපාරට ඉතුරුකර තිබෙන බිම), ඇලද, කිතුල්ගොඩගමගේ අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන දෙලලගම්හවත්තද, දෙලලග පැලවැටකෙයියාවේ කුඹුරුයායද (පරවෙනි); නැගෙණහිරට අලුත්ගෙදරවතතඅද්දරකුඹුර (පරවෙනි), වැරනියගොඩගේ සියදෝරිස් විසින් අයිතිවාසිකම්කියන කජුගහකුඹුරද, කේ. ඩබ්ලිව්. දවිත්අප්පු සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන නානවලලගකුඹුරද, ඉහලවෙල (පරවෙනි); දකුණට පිටුවල සිට ඇල්පිටියට යන ගම්සභාපාරද, ඉහලවෙල (පරවෙනි); බස්නාහිරට පිටුවල සිට ඇල්පිටියට යන ගම්සභාපාරෙන් කොටසක්ද, (කුඩාගල යන ගමේ ගම්ඉමද.)

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටිය මේ දැන්වීමෙන් අත්හැරියවගත් එය බිම්තරම වන පර්චස් 19ය ඉහතකී අක්කර 3කුත් රූඩ් 1කුත් පර්චස් 10යේ බිම්තරමේ අඩංගුනොවෙන වගත් මෙයින් දැනගත යුතුයි.

ලංකාමැනීමේ මුල් සිතියම 584.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 34 | නාරවැල්කැටියේකුඹුරඅද්දරමනාන | 0 0 19 |

[ගාල්ල වී. ම. 1—1924.]

---

[කුරුණෑගල දැන්වීම නො. 8,598.]

වම් 1924ක්වූ මැයි මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වම් 1897, 1899, 1900යේ සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇජ්. ලීච් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇජ්. ලීච්.
විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩමට උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ වන්නිහත්පත්තුවේ කටුවන්නකෝරලේ උනගස්වැව යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටිය, එනම්:—

ලංකාමැනීමේ මුල් සිතියම 1,920.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 7 | වානේහේන (රේල්පාර සහ ඊට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය) | 2 1 1 |

මීට මායිම්—උතුරට කෝන්ගහමූලහේනද (ප්‍රවෙනි) වැවගාවහේන්යායද (91,116 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමෙන් කොටසක්ද) නැගෙනහිරට වැවගාවහේන්යායද 91,116 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමෙන් කොටසක්ද, මැදපොකුනේ හේන්යායද (ප්‍රවෙනි) දකුනට දන්පිටිගම යන ගමේ ගම්ඉමද, වානේහේනද (ප්‍රවෙනි) වැවගාවහේන්යායද (91,116 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමෙන් කොටසක්ද); බස්නාහිරට වැවගාවහේන්යායද, (91,116 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමෙන් කොටසක්ද) වානේහේනද (ප්‍රවෙනි) කිතුල්ගැර ගම යන ගමේ ගම්ඉමද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 539වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුණෑගල වී. ම. 19—1924.]

[කුරුණෑගල දැන්වීම නො. 8,599.]

වර්ෂ 1924ක්වූ මැයි මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇප්. ලීච්. උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් ජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙසින් දැනගත යුතුයි.

ඇප්. ලීච්,
විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාලහත්පත්තුවේ නිකාවගම්පහකෝරළේ තලාව යන ගමේ පිහිටා තිබෙන මිට අමුණාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—ලංකාමැනීමේ මූල් සිතියම 1,879.

| බිම්කට්ටිය | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප |
|---|---|---|
| 36 | වෑකන්දවදකහගොල්ලෑවත්ත | 0 0 27 |
| 38 | වෑකන්දකොට්ටගහවතත | 0 1 32 |
| 40 | වෑකන්දකෝන්ගගවත්ත (ඉඩම්මැදින් යන ඇල අත්හැරයි) | 0 0 25 |
| | | 0 3 4 |

මිට මායිම්—උතුරට විජේකෝන් මුදියන්සෙලාගේ පිකිරිබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන වෑකන්ද කොම්ටගහවත්තද, විජේකෝන්මුදියන්සෙලාගේ මුදියන්සෙ විසින් අයිතිකම්කියන වෑකන්ද වදකහගොල්ලවත්තද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන ගෙදවට සහ මුඩුබිමත්ද (වැවට යන පාර); නැගෙනහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන තලාවැවද (වැව සහ කන්ඩිය); දකුනට ආණ්ඩුව විසින් අයිතිකම්කියන තලාවැවද (වැව සහ කන්ඩිය), ආණ්ඩුව විසින් අයිතිකම්කියන වෑකන්දපාවුලගේනද; බස්නාහිරට ඒ. උක්කුබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන තලාවෙව්වෙල්යායද, විජේකෝන් මුදියන්සෙලාගේ පිකිරිබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන වෑකන්ද කොම්ටගහවත්තද.

II.—ලංකාමැනීමේ මූල් සිතියම 1,879.

| බිම්කට්ටිය | ඉඩමේ නම. | බිම්තරම; අ. රූ. ප. |
|---|---|---|
| 29 | වෑකන්ද දඹගහමුලවත්ත | 0 1 18 |
| 33 | වෑකඳකෙහෙල්කොටුව | 0 0 10 |
| 34 | මීගහවත්ත | 0 0 7 |
| | | 0 1 35 |

මිට මායිම්—උතුරට උක්කුබන්ඩාගේ මුතුමැණිකා සහ තවත් අයෙක් විසින් අයිතිකම්කියන මීගහවත්තද, වන්නියාමිගේ හීංගිරිහාමි විසින් අයිතිකම්කියන වෑකන්ද කෙහෙල්කොටුවද, බන්ඩගේ වන්නියාමි සහ තවත් අයෙක් විසින් අයිතිකම්කියන වෑකන්ද දඹගහමුලවත්තද; නැගෙනහිරට අප්පුහාමිගේ හෙරත්හාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන ගංගොඩද; දකුනට ආණ්ඩුව විසින් අයිතිකම්කියන තලාවැවද (වැව සහ කන්ඩිය); බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන ගෙදවට සහ මුඩුබිමද (වැවට යන පාර).

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 540වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුණෑගල වි. ම. 20—1924.]

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම්.

මෙහි පහත සඳහන්වෙන කාලවල්වලට බස්නාහිර දිසාවේ මෙහි පහත සඳහන්වෙන තොටුපල් රේන්දය පළමු ගැනුම්කාරයින් විසින් වර්ෂ 1924ක්වූ අප්‍රේල් මාසේ මාස්මුදල් හෝ එයින් හිඟහිටපු යම් කොටසක් වර්ෂ 1924ක්වූ මැයි මස 23වෙනි දිනදී නොහොත් ඊට ප්‍රථම දිනකදී නොගෙව්වොත් ඔවුන්ගේ අලාබේ වෙනුවට එකී රේන්ද වර්ෂ 1924ක්වූ මැයි මස 23වෙනි සිකුරාදා දවල් 12ට කොළඹ කච්චේරියේදී නැවත විකුණන බව මෙසින් දන්වනුය.

නැවත විකිණීමේදී ගැනුම්කාරයින් විසින් ගත් මුදලෙන් දහයෙන් කොටසක් විකිණීමේ දවසේදී මෙහි තබන්ට ඕනෑය.

නැවත විකිණීමේදී රේන්දය විකුනන්ට බැරිවුනොත්, වර්ෂ 1905 නොවැම්බර 21වෙනි ආඥාපණතේ ප්‍රකාරයට පළමු ගැනුම්කාරයින්ට විරුඬව ක්‍රියාකරනු ලැබේ.

වර්ෂ 1924ක්වූ ජූනි මස 1වෙනි දින පටන් වර්ෂ 1924ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා.

1. හැඳල ඇල රේන්ද.
2. මීගමු ඇලේ රේන්ද.
3. ග්‍රෑන්ඩ්පාස් ඇල රේන්ද.
4. කිත්තන්පහුවේ ඇල රේන්ද.
5. මෝදර තොටුපල් රේන්ද.

ආර්. ඇන්. තේන්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්ශ.

වර්ෂ 1924ක්වූ මැයි මස 5වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වර්ෂ 1912යේ අංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

### බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ රා රේන්ද, 1924–1925.

මිට යාකර තිබෙන A අක්ෂරය දරණ කැබියුල් පත්‍රයෙහි සඳහන්වන කොන්දේසිවලට යටත්කොට මිට යාකර තිබෙන B අක්ෂරය දරණ කැබියුල් පත්‍රයෙහි සඳහන්වන ගම්වල මිලටගත් අයවලුන් විසින් පිහිටුවන්ට යෙදෙන තැබෑරුම්වල වර්ෂ 1924ටේ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් 1925යේ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා රා බෙදා විකිණීමේ බලය බස්නාහිර පලාතේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1924ක්වූ ජූනි මස 19වෙනි බෘහස්පතින්දා උදේ 10ට

සහ උවමනාවූයිනම් එම ඒජන්ත උන්නාන්සේ විසින් දැනුම්දෙන ප්‍රකාර, ඊට පසු දිනවලත් කොළඹ කච්චේරියේදී වෙන්දේසියේ විකුණන බව මෙයින් දැනුම්දෙන්ට යෙදුනා ඇත. ඒ ඒ ගම්වල ඒජන්ත උන්නාන්සේ විසින් හොඳයකියා ඒත්තුගන්ට යෙදෙන ස්ථානයක එක තැබෑරුමකට වැඩියෙන් පිහිටුවන්ට ඉඩදෙනු නොලැබේ.

2. මතුකී B අක්ෂරය දරණ ෂැඩ්යුල් පත්‍රයෙහි සඳහන්වන ගම්වල ඇර වෙනත් ගම්වල රා විකිණීමට ඉඩදෙනු නොලැබේ.

3. (a) තැබෑරුම් දැනට පිහිටා තිබෙන ස්ථානෙන් වෙන යම් ස්ථානයකට ගන්ට ඕනෑකළ විට ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1919යේ පෙබරවාරි මස 12වෙනි දින නොම්මර 85 දරණ ඇක්සයිස් රෙගුලාසියේ IV. වෙනි කාණ්ඩ 5වෙනි වගන්තිය යටතේ මාසයකට ප්‍රථමින් දැන්වීමක් ප්‍රසිද්ධකරන්ට ඕනෑය. එම්නිසා ගැනුම්කාරයන් විසින් තැබෑරුම් පිහිටුවීමට අදහස්කර තිබෙන ස්ථාන සඳහන්කරනලද ඉල්ලුම්පත්‍ර ප්‍රමාදනොකර ඒජන්ත උන්නාන්සේ වෙත යැවිය යුතුයි.

(b) ඒජන්ත උන්නාන්සේ විසින් විභාගකර බලා තැබෑරුම් පිහිටා තිබෙන ස්ථාන ගැන පෙන්නා තිබෙන විරුද්ධකම් හරිබවට බාරගත්විට මොනයම් තැබෑරුමක් ගැනවත් කලින් ගෙවා තිබෙන මුදල් ආපසු දෙනු නොලැබේ.

4. කොන්දේසිවල 2 (a) වෙනි වගන්තියේ සඳහන්කර තිබෙන ඇප ඔප්පුවේ සහ කොන්දේසිවලත් වර්ෂ 1919යේ මුද්දර රෙගුලාසියෙන් ඕනෑකරන මුද්දර නියමද, මුද්දරවලින්ම ගැනුම්කාරයා විසින් ගෙවන්ට ඕනෑය.

5. කොන්දේසිවල 2වෙනි වගන්තියේ (b) කොටසයේ සඳහන්වෙන කාරණ රේන්ද මිලයටගන්ට යෝජනාකරන අයවළුන් විශේෂවසයෙන් සැලකිය යුතුයි.

6. විශේෂ කරුණු නැතිවිට තැබෑරුම් වසන්ට යෙදුනාවූ සියලුම පලාත්වල ගස්මැදීමට බලපත්‍ර දෙනුනොලැබේ.

7. මේ ගැන වැඩිදුර කාරණ ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගත හැකිය.

වර්ෂ 1924ක්වූ මැයි මස 5වෙනි දින කොළඹ ආණ්ඩුවේ
ඒජන්ත උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඇන්. හේන්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වම්හ.

---

### A.—ෂැඩ්යුල් පත්‍රය.

### රා රේන්ද විකිණීමේ කොන්දේසි.

ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකරනු ලබන සහ මෙම රා රේන්ද කාලය ඇතුලත වලංගුවන්නාවූ සියලුම ඇක්සයිස් ලයිසන්ස්වලට වැටහෙන්නාවූද සාමාන්‍ය කොන්දේසිවලට වැඩිමනත්වූද, වර්ෂ 1924ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1925ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා B අක්ෂරය දරණ ෂැඩ්යුල් පත්‍රයේ මෙහි පහත සඳහන්වූ ගම් ඇතුළත රා බෙදා විකිණීමේ තනි අයිතිවාසිකම විකුණන කොන්දේසි මෙහි පහත දක්වනු ලැබේ.

1. යම් කිසි ලන්සුවක් නොහොත් ටැන්ඩරයක් බාරනොගැනීම සුදුසුය කියා ආණ්ඩුවේ ඒජන්ත තුමාට කල්පනාවේනම් ඒ ලන්සුව නොහොත් ටැන්ඩරය බාරනොගන්ට එතුමාට බලය තිබේ. ඒ බලයට යටත්ව ඉතා වැඩිගණනට ඉල්ලුම්කරන්නාට නොහොත් ටැන්ඩරකරන්නාට ඒ අයිතිවාසිකම දෙනු ලැබේ, තවද අයිතිවාසිකම විකුණනලද්දේ යම් කොන්දේසි පිටද ඒ කොන්දේසි සියල්ලටම ඔහු යටත්වෙන්ටත් ඒවා ඉෂ්ටකරන්ටත් ඔහු බැඳී සිටියි.

2. (එ) බලය දෙනුලැබූ අය විසින් බලය දෙනුලැබූ බව ප්‍රකාශකළවිට මේ විකිණීමේ කොන්දේසිපත්‍ර එවලේම අත්සන්කොට එකල්හිම ඇප බැඳීමක් වශයෙන්, දෙමාසෙක රේන්ද මුදලට සමාන මුදල් ගණනක් ආණ්ඩුවේ ඒජන්තතුමාට ගෙවන්ට ඕනෑය. මේ කොන්දේසිවලින් යම් එකක් කඩකිරීම ගැන, එකී මුදල සම්පූර්ණයෙන් නොහොත් එයින් කොටසක් රාජසන්තක කිරීම යුතුය කියා ආණ්ඩුවේ ඒජන්තතුමාට කල්පනාවේනම් එසේකරනුලැබීමට එකී මුදල යටත්ය. ඒ රාජසන්තකකිරීමනම් එකී කඩකිරීම ගැන මේ කොන්දේසිවලින් නියමකර තිබෙන වෙනයම් දඬුවමක් ඇත්නම් ඊට වැඩිමනත් වශයෙන්ය. එකී ඇප බැඳීම අයිතිවාසිකම ලබන්නා විසින් ඉහළ නියමකළ අයිතිවාසිකම විකුණලා 14 දවසක් ඇතුළතදී T 23 යන ඇක්සයිස් ෆෝර්මයේ හැටියට ඔප්පුවක් පිටකළ යුතුයි.

(බී) 1වෙනි කොන්දේසිය පිට ඉල්ලන්ට යෙදුණු නොහොත් ටැන්ඩර්කරපු ඉතා වැඩිගණන රුපියල් 2,000කට වැඩිවී නම්ද ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් ඕනෑකළොත්ද බලය දෙනුලබන්නා විසින් මේ දෙනුලැබූ අයිතිවාසිකම නිසා ගෙවියයුතු යම් මුදලක් අයකිරීමට ඔහුට විරුද්ධව පවරනලද යම් නඩුවකදී නඩුතීන්දුවට යටත්වන හැටියට නීතියට එකඟවන ෆෝර්මයකින් අතෝර්නි බලයක් එකල්හිම ලියවා දෙන්ට ඕනෑය.

(සී) විකිණීමේ කොන්දේසිය අත්සන්කරනවිට බලය දෙනුලබන්නා විසින් ඉහතකී අයිතිවාසිකම සම්බන්ධ නොතිසි සිතාසි ආදිය රිජිස්තර්කර යවන පිණිස තපල්කන්තෝරුවක් තෝරාගෙන එය තමාගේ අත්සන් ඇති ලියවිල්ලකින් නියම කරන්ට ඕනෑය. තවද එසේ නියමකරනලද තපල් කන්තෝරුවට එකී නම ගම ඇතුව නිසිලෙස තපල්කරනුලබන ඉහතකී ආකාරවූ සෑම නොතිසි සහ සිතාසි ඒවා අතින් භාරදුන්නාක්මෙන් ස්ථිර හැටියට සියලු කාරණවලදී කල්පනා කරනු ලැබේ.

3. බලය දෙනු ලැබූ අය විසින් ගැනුම් මුදල නොහොත් බදුමුදල සමාන කොටස් 12කින් මාස්පතාද. ගාස්තු සහ වට්ටිනාකමද වෙනත් ඔහුගෙන් ආණ්ඩුවට ගෙවියයුතු මුදලද ආණ්ඩුවේ ඒජන්තතුමාට ගෙවිය යුතුයි. පළමුවෙනි කොටස වර්ෂ 1924ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දිනටද ඉතිරි කොටස් ලබන ලබන එක එක මාසේ අන්තිම දිනටද ගෙවිය යුතුයි. හිඟ හිටින මුදලට අවුරුද්දට සියේට 9 ගණනේ පොලී ගෙවිය යුතුයි.

4. බලය දෙනුලැබූ අයගෙන් ආණ්ඩුවට ලැබියයුතු යම් මුදලක් ගෙවීමගැන ඊට කච්චේරියෙන් දෙනලද කුවිතන්සියක් ඔහු විසින් පෙන්වා සිටියොත් මිස නැත්නම් එය යුතුවූ ප්‍රකාර කළාවූ ගෙවිල්ලක්මෙන් සලකනු නොලැබේ. තවද බලයදෙනු ලැබූ අයගේ පහසුව පිණිස සරප්තැන හෝ වෙනයම් කච්චේරියේ මුලාදෑනියෙක් හෝ ලඟ බලය දෙනුලැබූ අයට සුදුසුයකියා කල්පනාවෙන කිසියම් මුදලක් තබන්ට යෙදුනොත් එය මේ පොරොන්දුපත්‍රය යටතේ ගෙවනලද මුදලක්මෙන් සලකනුනොලැබේ.

5. ගැනුම් මුදලේ නොහොත් බදු මුදලේ මාස් මුදලද නොහොත් කොටසක්ද, ගාස්තුද, වට්ටිනාකමද, වෙනත් බලය දෙනු ලැබූ අයගෙන් ආණ්ඩුවට ගෙවියයුතු මුදලද ගෙවන්ට තිසිවූද, ගෙවියයුතුවූද කාලයට නොගෙවා තිබුනොත්, බලයදෙනු ලැබූ අයට දෙනලද ලයිසන්ස් කඩදාසිය නොහොත් ලයිසන්ස් කඩදාසි අවලංගුකරන්ට අදහස්කර තිබෙන බව දවස් 15ක් කල්තියා ඔහුට දැනුම්දී, වැඩිමනත් නඩුමගක් නැතුව එසේ අවලංගුකරන්ටද අයිතිවාසිකම නැවත විකිණීමෙන් වියහැකි අවාසියටත් අලාබයටත් පළමු බලය දෙනුලැබූ අයව යටත්කොට ඒ අයිතිවාසිකම නැවත විකුණන්ටද ආණ්ඩුවේ ඒජන්ත තුමාට බලය තිබේ. මෙකියන දැනුම්දීම ආණ්ඩුවේ ඒජන්තතුමා නියමකරන අන්දමට කළහැකිය.

6. විකුණන්ට බලකඩදාසි (ලයිසන්ස්) දෙනුලැබූවිට, එය ලැබූ අය එක එක තැබෑරුමේ විකිණීමට රා ගැනීම පිණිස මදින්ට යන ගස් ගණන් සහ ඒවා පිහිටි ස්ථාන පෙන්නුම්කර, නියම ෆෝර්මයක ලියාපු ඉල්ලුම්පත්‍රයක් මත්පැන් බද්දේ සුපිරින්ටැන්ඩන්ට්තුමාට හෝ උප සුපිරින්ටැන්ඩන්ට්තුමාට දියයුතුයි. තවද ගස්වල ගණන්, ස්ථාන, මදින්නාගේ නම, රා දෙන්ට කල්පනාකර තිබෙන තැබෑරුම, යන මේවා පෙන්නුම්කරන බලකඩදාසියක් (ලයිසන්ස් පත්‍රයක්) පිට මිස මේ කී කාරණය ගැන කිසිම ගහක් මදින්ටවත් කිසිම ගහකින් රා ගන්ටවත් බැරිය.

යම්කිසි තැබෑරුමක විකිණීම පිණිස රා මැදීමට අවසර ඉල්ලා එවන යම්කිසි ඉල්ලීමකට බලවත් විරුද්ධතා ඇතැයි සිතහොත් (ඇක්සයිස් කොමසාරිස්තුමාගෙන් නැවත ඉල්ලීමට ඉඩතබා) එම ඉල්ලීම ප්‍රතික්ෂේපකිරීමට මත්පැන් බද්දේ සුපිරින්ටැන්ඩන්ට්තුමාට හෝ උප සුපිරින්ටැන්ඩන්ට්තුමාට බලය තිබේ.

7. ඇක්සයිස් කොමසාරිස්තුමා විසින් නියමකර තිබෙන අන්දමට ලකුණුකර තිබෙහොත් මිස නැත්නම් කිසිම ගහක් මදින්ටවත් ඒකෙන් තැබෑරුමක විකිණීමට තැබීම පිණිස රා ගන්ටවත් බැරිය. තවද මත්පැන් බද්දේ සුපිරින්ටැන්ඩන්ට්තුමා විසින් හෝ උප සුපිරින්ටැන්ඩන්ට්තුමා විසින් දෙනලද බලකඩදාසියක් නැතුව තැබෑරුමට රා ගෙනෙන්ටද බැරිය. රා ගෙනයන තැනැත්තාගේ නම සඳහන්කොට එම බලකඩදාසිය බලය ලැබූ තැනැත්තා වෙත නිකුත්කරණු ලැබේ. ඔහු විසින් එය රා ගෙනයන තැනැත්තාට දියයුතුය.

(*a*) රාවලින් විනාකිරි සෑදීමට, කැමති රේන්දකාරයින්, ප්‍රථමකොට විනාකිරි සෑදීමට ලයිසන් පත්‍රයක් ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත යුතුයි.

ආණ්ඩුව විසින් පිළිගෙන තිබෙන කොන්දේසිවලට යටත්ව සහ ආණ්ඩුවේ අදහස්වලට එකඟව රේන්දකාරයන් නොවන අයට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් විනාකිරි සෑදීමට ලයිසන්පත්‍ර දීමටද බලය තිබේ.

(*b*) විනාකිරි සෑදීමට බලපත්‍රලත් අය විසින් ඇක්සයිස්, කොමසාරිස්තුමා විසින්, පිළිගන්නාලද, ස්ථානවල විනාකිරි තැබිය යුතුයි. විනාකිරිවලට හරවනලද, රාවල සහ විකුනනලද විනාකිරිවලද, හරිආකාර ගණන් ඇක්සයිස්කොමසාරිස්තුමා විසින් නියමකරණ ප්‍රකාරයට අනුව තැබිය යුතුයි.

8. බලකඩදාසි ලැබූ අයම ගස් මැද රා ගන්නවා නම් හෝ ඒ වැඩේ ඔහු විසින් වෙන කෙනෙකුට පවරපාලද්දේනම් හෝ ඒ මදින අය ගස්මදින නොහොත් රා ගන්න වේලෙහි නිතරම ලයිසන්ස් කඩදාසිය තමා වෙත තිබාගෙන ඉන්ට ඕනෑය. තවත් යම් ඇක්සයිස් මුලාදෑනියෙක් නොහොත් ගම් මුලාදෑනියෙක් එය බලන්ට ඉල්ලූවිට වහාම පෙන්වන්ටද ඕනෑය.

9. බලකඩදාසිය ලැබූ අයට ඔහුගේ රේන්දයට අයිති සීමාව ඇතුලත අරක්කු විකිණීම ගැන නොහොත් අරක්කු විකිණීමේ යම් අයිතිවාසියක් මිලට ගැනීම ගැන තමාගේ සම්බන්ධයක් නොහොත් පංගුකාරකමක් තමානමින් හෝ වෙන මාර්ගයකින් හෝ තිබාගන්ට බැරිය.

10. උප කොමසාරිස් තුමාගෙන් ලියවිල්ලකින් ලබාගත් බලයක්පිට මිස නැතුව යම් නියමකරණලද තැබෑරුමකට බලය ලබා ලකුණුකරනලද ගස්වලින් ගන්නා රා හැර වෙන රා ඒ තැබෑරුමේ තබාගැණීමට හෝ වෙළඳාමට තැබීමට හෝ විකිණීමට බැරිය.

11. ගැලොමක් ශත 40ට අඩු මිල ගණනකට රා විකුණන්ට අවසර නැත. ඊට වැඩි තරම් විකිණීමද ගැලොමක් ශත 40 වැටෙන ප්‍රමාණයට වියයුතුයි.

12. බලයදෙනු ලබන්නාට යම් තැබෑරුමකට ස්ථානයක් ලබාගන්ට බැරිවුණිනම් ඒ ගැණ ස්ථානයක් පංගාර්තුකර දීමට ආණ්ඩුවේ ඒජන්තතුමා බැඳීනැත්තේය.

13. ගැනුම්කාරයාගේ අයිතිවාසිකම පටන්ගන්නාවූ දිනේ සිට දවස් දහයක් ඇතුළත නොහොත් ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් කල්දෙනලද කාලයක් ඇතුළත, ගැනුම්කාරයා විසින් ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් ඉල්ලුම්කර තමාගේ අයිතිවාසිකමට සීමාවන ප්‍රදෙශය ඇතුළත තැබෑරුම්වලදී රා බෙදා විකිණීමට බලකඩදාසියක් නොහොත් බලකඩදාසි ලබාගතයුතුයි.

14. (*a*) යුධ හේවායන් ගමන්කරන අතර යම් ස්වල්ප කාලයක් යම් පාරක තැබෑරුම් වසා තිබීම උවමනා බව පෙනී එසේ වසා තිබන්ට ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් නොහොත් උප ඒජන්තතුමා විසින් නියමකරන්ට යෙදුණොත් ඒ නිසා නොහොත් කිසියම් කාරණයකින් වෙන්ට යෙදුණාවූ යම් අලාභයක් නිසා මුදලක් අත්හැරදමන්ට කියා ඉල්ලුම්කරන්ට ගැනුම්කාරයාට යුතුකමක් ඇත්තේ නැත.

(*b*) ඡන්දය ගන්න දිනවලදී ඒජන්තඋන්නාන්සේ හෝ දෙවෙනි ඒජන්තඋන්නාන්සේ විසින් ඒ ඡන්දය දෙන පලාත්වලට අයිති සියළුම තැබෑරුම් වැසීම පිණිස අණකරනුලැබේ. මේ සම්බන්ධව බලය දෙනුලැබූ අයට රේන්දය වෙනුවට ගෙවන්ට යෙදුන මුදලෙන් කිසිවක් ආපසු ඉල්ලීමට බලයක්නැත.

15. (*a*) වර්ෂ 1914රේ 32වෙනි ආඥාපනතේ කියා තිබෙන හැටියට පුරුදු අපරාධකාරයෙක්වූ අයෙකුගේ ලන්සුවක් භාරගනු නොලැබේ.

(*b*) මිලේටගත් අය එකී ආඥාපනතේ අදහසේ හැටියට පුරුදු අපරාධකාරයෙක් නොවන බව පෙන්නුම්කරන්ට කියා ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් කියා සිටි විටක එසේ කළයුතුයි.

16. B අක්ෂරය දරන ෂැඩුල් පත්‍රයේ සඳහන්කර තිබෙන සීමාටල් තුළ නියමකර තිබෙන තැබෑරුම්, C අක්ෂරය දරන ෂැඩුල් පත්‍රයේ සඳහන්කර තිබෙන වෙලාවල්වලට අරින්ට සහ වසන්ටත් ඕනෑය. වසන්ට නියම වේලාව සහ අරින්ට නියම වේලාවත් අතර එවැනි තැබෑරුමක රා විකුණන්ට බැරිය.

---

## B.—ෂැඩියුල් පත්‍රය.

### කොළඹ දිස්ත්‍රික්කේ රා රේන්ද.

| රා තැබෑරුම්වල නොම්මර සහ ඒවා පිහිටුවන ස්ථානය (එනම් මෙහි සඳහන්වූ ගම් ඇතුළත). | | පේරු සහ කොඨාස වශයෙන් රා රේන්දයට අයිති ප්‍රමාණය. |
|---|---|---|
| | **උතුරු අළුත්කුරුකෝරලේ.** | |
| 1 | බම්බුකුලිය .. .. | නැගෙනහිර ඔතර |
| 2 | ඇත්ගාල .. .. | එම |
| 3 | දළුපොත .. .. | බස්නාහිර ඔතර |
| 4 | පලගතුරේ .. .. | එම |
| 5 | පෝරුතොට .. .. | එම |
| 6 | කොච්චිකඩේ .. .. | එම |
| 7 | දූගොන්න .. .. | ගොඩකහ පලාත |
| 8 | දෙමන්හන්දිය .. .. | එම |
| 9 | කටුනායක . .. | ආඩිඅම්බලම පලාත |
| 10 | මුකලන්ගමුව .. .. | එම |
| 11 | බෝලවලාන .. .. | මීගමුවේ නගරෙ |
| 12 | කුරන .. .. | එම |
| 13 | කාමච්චෝඩෙ .. .. | එම |
| 14 | හුනුපිටිය .. .. | එම |

| රා තැබෑරුම්වල නොම්මර සහ ඒවා පිහිටුවන ස්ථානය (එනම් මෙහි සඳහන්වූ ගම් ඇතුළත). | | පේරු සහ කොඨාස වශයෙන් රා රේන්දයට අයිති ප්‍රමාණය. |
|---|---|---|
| | **උතුරු අළුත්කුරුකෝරලේ.** | |
| 15* | උඩයාර්තෝප්පුව .. | මීගමුවේ නගරය |
| 16 | පිටිපන .. .. | තලාහේනේ පලාත |
| 17 | සෙත්තපාඩුව .. .. | එම |
| 18 | බාසියාවත්ත .. .. | එම |
| | **අළුත්කුරුකෝරලේ (දකුණ).** | |
| 19 | බෝපිටිය .. .. | හැඳල පේරුව |
| 20 | පුල්ලුහේන .. .. | එම |
| 21 | උස්වැටකෙයියාව .. | එම |
| 22 | තිඹිරිගස්යාය .. .. | එම |
| 23 | රාගම .. .. | කඳාන පේරුව |
| 24 | කඳාන .. .. | එම |
| 25 | වැලිගම්පිටිය .. .. | එම |
| 26 | දඹුගම .. .. | දඹුගම පේරුව |

* දැනට තැබෑරුම පිහිටා තිබෙන ස්ථානයට ලයිසන්ස් කඩදාසිය දෙනු නොලැබේ.

| රා තැබෑරුම්වල නොම්මර සහ ඒවා පිහිටුවන ස්ථානය (එනම් මෙහි සඳහන්වූ ගම් ඇතුළත). | | පේරු සහ කොඨාස වශයෙන් රා රේන්දයට අයිති ප්‍රමාණය. |
|---|---|---|
| | **හේවාගම්කෝරලය.** | |
| 27 | පූවක්පිටිය .. | .. කොස්ගම |
| | **කොළඹ මුදලිතුමාගේ කොඨාසය.** | |
| 28 | මායිම්—උතුරෙන් හරිවීදිය, නැගෙනහිරින් 1වෙනි හරස්වීදිය, දකුණෙන් නොරිස්වීදිය, බස්නාහිරෙන් මල්වත්තේ වීදිය | පිටකොටුව පලාත (මල්වතු වීදිය තැබෑරුම) |
| 29 | මායිම්—උතුරෙන් හරිවීදියේ දකුනු පැත්ත, නැගෙනහිරෙන් 4වෙනි හරස්වීදිය, දකුණෙන් නොරිස් වීදිය, බස්නාහිරෙන් 2වෙනි හරස් වීදිය | පිටකොටුව පලාත (4වෙනි හරස් වීදිය තැබෑරුම) |
| 30 | මායිම්—උතුරෙන් රැක්ලමේසන් රෝඩ් නැමතිපාර, නැගෙනහිරින් සන්තජෝන් වීදිය, දකුනෙන් හරිවීදියේ උතුරුපැත්ත, බස්නාහිරින් 1වෙනි හරස් වීදිය | පිටකොටුව පලාත (මාර්කට් වීදිය තැබෑරුම) |
| 31 | මායිම්—උතුරෙන් වෙල්ලවීදිය නැගෙණහිරෙන් සන්තබස්තියම් වීදිය, දකුණෙන් සනතබස්තියම් කන්ද, බස්නාහිරෙන් සෝන්ඩර්ස් ප්ලේස් සහ ක්‍රමර් මුඩුක්කුව | සනතබස්තියම පලාත (සෝන්ඩර්ස් ප්ලේස් තැබෑරුම) |
| 32 | මායිම්—උතුරෙන් ජින්තුපිටියවීදියේ දකුණුපැත්ත, නැගෙනහිරෙන් මොහොම්ඩිවීදිය සහ කුරුවේවීදිය, දකුණෙන් අලුත්ගොන් වීදිය, වෙල්ලවීදියේ හන්දිය දක්වා එතන සිටන් වෙල්ලවීදියේ කයිමන්දොරකඩ දක්වා, බස්නාහිරෙන් සෙක්කුවීදිය | සන්තපාවුලු පලාත (සෙක්කු වීදිය තැබෑරුම) |
| 33 | මායිම්—උතුරෙන් ජම්පටා වීදියේ දකුණුපැත්ත, නැගෙනහිරෙන් මොහොට්ටිවීදිය, දකුණෙන් ජින්තුපිටියවීදියේ උතුර පැත්ත නාටුකෝට්ටවීදිය දක්වා නාටුකෝට්ටවීදිය සහ වැල්ලේවීදියට යන හරස්පාර, බස්නාහිර වැල්ලේවීදිය සහ කොච්චිකඩේවීදිය | සන්තපාවුලුපලාත (කොච්චිකඩේ වීදිය තැබෑරුම) |
| 34 | මායිම්—උතුරෙන් සහ නැගෙනහිරෙන් ඉස්කිනර්ස් රෝඩ් උතුර, දකුණෙන් පනික්කිවීදිය. හිල් වීදිය සහ ජම්පටාවීදියේ උතුරු පැත්ත, බස්නාහිරෙන් කොච්චිකඩේ වීදිය | කොටහේන පලාත (කෝටුබෝම්වීදිය තැබෑරුම) |
| 35 | මායිම්—උතුරෙන් සැම්වරී රෝඩ් නම් වීදිය, නැගෙනහිරෙන් කොටහේනවීදිය, දකුණෙන් පිකරින්ස් රෝඩ්නම් වීදිය. බස්නාහිරෙන් සන්තියාගු වීදියේ නැගෙනහිර පැත්ත | කොටහේන පලාත (පිකරින්ස් වීදිය තැබෑරුම) |
| | **කොළඹ මුදලිතුමාගේ කොඨාසය.** | |
| 36 | මායිම්—උතුරෙන් මාදම්පිටියපාරේ වික්ටෝරියා බ්‍රිඩ්ජ් වීදියේ හන්දිය දක්වා එතන සිටන් වික්ටෝරියා බ්‍රිඩ්ජ් වීදිය සහ කැළණිගඟ, නැගෙනහිරෙන් ඌරුගොඩවත්ත ඇල, දකුණෙන් සහ බස්නාහිරෙන් සැම්වරී රෝඩ් නම් පාර | කොටහේන පලාත (මාදම්පිටිය පාර තැබෑරුම) |
| 37 | මායිම්—උතුරෙන් මාදම්පිටිය පාර, නැගෙනහිරෙන් අලුත් මාවත පාර, දකුණෙන් පිස්සර්ස්කුවාටර්ස් නම් ස්ථානය, බස්නාහිරෙන් පිස්සර්ස් හිල් යන ස්ථානය සහ මෝදර වීදිය | කොටහේන පලාත (මාර්ෂල් වීදිය තැබෑරුම) |
| 38 | මායිම්—උතුරෙන්, නැගෙනහිරෙන් සහ බස්නාහිරෙන් කැළණිගඟ, දකුණෙන් මාදම්පිටිය පාර සහ වික්ටෝරියා බ්‍රිඩ්ජ් වීදිය | කොටහේන පලාත (මෝදර වීදිය තැබෑරුම) |
| 39 | ගාල්ලට යන පාරේ ඇතුළත නොහොත් ඒ සමීපයේ 1වෙනි සහ 2වෙනි හැතැප්ම කනු අතරේ මෙහි සඳහන් කරන වෙනින් රේන්දයකට අයිතිනැති හරිය | කොල්ළුපිටිය පලාත (කොල්ළුපිටිය තැබෑරුම) |
| 40 | ගාල්ලට යන පාරේ ඇතුළත නොහොත් ඒ සමීපයේ 3වෙනි සහ 4වෙනි හැතැප්ම කනු අතරේ මෙහි සඳහන් කරන වෙනින් රේන්දයකට අයිතිනැති හරිය | වැල්ලවත්ත පලාත (බම්බලපිටිය තැබෑරුම) |
| 41 | මායිම්—උතුරට කිරුල්ලපනේ ඇල, නැගෙනහිරෙන් සහ දකුණෙන් දෙහිවල ඇල. බස්නාහිරෙන් මූද | වැල්ලවත්ත පලාත (වැල්ල වත්තෙ තැබෑරුම) |
| 42 | 2වෙනි මරදානේ ඇතුළත නොහොත් ඒ සමීපයේ මෙහි සඳහන් කරන වෙනින් රේන්දයකට අයිතිනැති හරිය | මරදාන පලාත (2වෙනි මරදානෙ තැබෑරුම) |
| 43 | 3වෙනි මරදානේ ඇතුළත නොහොත් ඒ සමීපයේ මෙහි සඳහන් කරන වෙනින් රේන්දයකට අයිතිනැති හරිය | මරදාන පලාත (3වෙනි මරදානෙ තැබෑරුම) |
| 44 | රැසවොයර් රෝඩ් යන පාර සහ ඩේලසින් පාරටත් මැදිව පිහිටා තිබෙන දෙමටගොඩ පාරේ නොහොත් ඒ සමීපයේ මෙහි සඳහන් කරණ වෙනින් රේන්දයකට අයිති නැති හරිය | මරදාන පලාත (දෙමටගොඩ තැබෑරුම) |
| 45 | මැලේ වීදිය නොහොත් ජ වීදියේ ඇතුළත නොහොත් ඒ සමීපයේ වෙනින් රේන්දයකට අයිති නැති හරිය | කොම්පඤ්ඤවීදියේ පලාතේ (ජවීදිය තැබෑරුම) |
| 46 | දෙහිවල ගල්කිස්ස | |

## C.—ෂැඩ්යුල් පත්‍රය.

### රා තැබෑරුම් අරින වහන වේලාවල්.

| දිස්ත්‍රික්කුව. | රා තැබෑරුම්. | අරින වේලාව. උදය. | වහන වේලාව. සවස. |
|---|---|---|---|
| කොළඹ .. | නාගරික සීමාව ඇතුළත තිබෙන තැබෑරුම් .. .. | 7 .. | 7 |
| එම .. | අයබදු කොඨාස සීමාවේ පිහිටා තිබෙන තැබෑරුම් .. | 7 .. | 7 |
| මීගමුව .. | ලෝකල් බෝඩ් සීමාවේ පිහිටා තිබෙන තැබෑරුම් .. | 7 .. | 7 |
| එම .. | අයබදු කොඨාස සීමාවේ පිහිටා තිබෙන තැබෑරුම් .. | 7 .. | 7 |
| මොරටුව .. | ලෝකල් බෝඩ් සීමාවේ පිහිටා තිබෙන තැබෑරුම් .. | 7 .. | 7 |

## කළුතර දිස්ත්‍රික්කයේ රා රේන්ද, 1924—25.

වර්ෂ 1924ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1925ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා ඇති දොළොස් මාසය තුළ පහත දක්වන හැබුල්පත්‍රයෙහි සඳහන්වන මඩුවල රා බෙදා වික්කිමේ අයිතිවාසිකම වර්ෂ 1924ක්වූ මැයි මස 23වෙනි සිකුරාදා පෙරවරු 11ට කළුතර කච්චේරියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බැව් මෙයින් දැනුම්දෙනවා ඇත.

විකිණීමේ කොන්දේසි ආදිය කළුතර කච්චේරියෙන් ඉල්ලුම්කර දැනගත හැකිය.

වර්ෂ 1924ක්වූ මැයි මස 3වෙනි දින කළුතර කච්චේරියේදීය.

එච්. ඒ. බර්ඩන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

හැබුල් පත්‍රය.

| නො. | කොටඨාසය. | මඩුව. |
|---|---|---|
| 1 | කළුතර තොටමුණේ .. | කුඩා පයියාගල ගම තුළ |
| 2 | එම .. | අලුත්ගම නගරය තුළ |

## රා රේන්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

මෙහි පහත සඳහන් ස්ථානවල 1924රේ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් 1925යේ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා දොළොස්මාසය ඇතුළතදී පැහිච්ච රා බෙදා විකිණීමේ අයිතිවාසිකම 1924රේ ජූනි මස 2වෙනි දිනවූ සඳුදා උදේ 9ට හලාවත කච්චේරියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දැනුම්දෙන්ව යෙදුනා ඇත.

2. විකිණීමේ කොන්දේසිය හා වෙනත් වැඩිදුර කාරණා මගෙන් ඉල්ලුම්කර ලබාගන්ට පුළුවන.

වර්ෂ 1924ක්වූ අප්‍රේල් මස 29වෙනි දින පුත්තලමේ කච්චේරියේදීය.

ආර්. ඇන්. බොන්ඩ්,
උප ඒජන්ත උන්නාන්සේ වම්හ.

හැබුල් පත්‍රය.

හලාවත දිස්ත්‍රික්කය.

| නො. | මන්ඩිය නොහොත් වැයික්කිය. | කොටඨාසය. | නො. | මන්ඩිය නොහොත් වැයික්කිය. | කොටඨාසය. |
|---|---|---|---|---|---|
| 1 | දකුනුවාවිටුව හලාවත .. | උතුරුපිටිගල්කෝරළේ හලාවත | 17 | තොඩුවාව .. | දකුනුපිටිගල්කෝරළේහලාවත |
| 2 | උතුරුවාවිටුව හලාවත .. | එම | 18 | ලිහිරියාගම .. | එම |
| 3 | කරුක්කුපොනෝ .. | එම | 19 | ලුනුවිල .. | එම |
| 4 | ආරච්චිකට්ටුව .. | එම | 20 | හාල්දඩුවන .. | එම |
| 5 | බත්තුලුඔය .. | එම | 21 | මොහොවිටිමුල්ල .. | එම |
| 6 | පම්බල .. | එම | 22 | දන්කොටුව .. | එම |
| 7 | ඔලීදලුව .. | එම | 23 | තම්බරවිල .. | එම |
| 8 | මාදම්පේ .. | එම | 24 | නාත්තුන්ඩන්කරේ .. | එම |
| 9 | ඉරවිටකුලම .. | එම | 25 | වයික්කාල් .. | එම |
| 10 | ගල්මුරුව .. | එම | 26 | නයිනාමඩම .. | එම |
| 11 | දුන්කන්නාව .. | දකුනුපිටිගල්කෝරළේ හලාවත | 27 | මිරිස්සන්කොටුව .. | එම |
| 12 | තබ්බෝව .. | එම | 28 | දුම්මලදෙනිය .. | එම |
| 13 | නාත්තන්ඩිය .. | එම | 29 | වෙන්නප්පුව .. | එම |
| 14 | මුදුකටුව .. | එම | 30 | උල්හිටියාව .. | එම |
| 15 | අඩප්පරගම .. | එම | 31 | කටුනේරිය | එම |
| 16 | මව්ටකොටුව .. | එම | | | |

පුත්තලම් දිස්ත්‍රික්කය.

| නො. | මන්ඩිය නොහොත් වැයික්කිය. | කොටඨාසය. | නො. | මන්ඩිය නොහොත් වැයික්කිය. | කොටඨාසය. |
|---|---|---|---|---|---|
| 1 | පුත්තලමේ කඩමන්ඩිය .. | පුත්තලම් කඩවත්හතර | 5 | මුක්කුවතොඩුවාව .. | පුත්තලම්පත්තුව |
| 2 | සේනකුඩිරිප්පුව .. | එම | 6 | මුන්දලම .. | එම |
| 3 | දලුව .. | පුත්තලම්පත්තුව | 7 | පත්තාලේ .. | කල්පිටිය |
| 4 | මදුරන්කුලිය .. | එම | 8 | කල්පිටිය .. | එම |

## කෑගල්ල දිස්ත්‍රික්කයේ රා රේන්දය, 1924—25.

වර්ෂ 1924ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1925ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මෙහි පහත සඳහන් ස්ථානවල රා බෙදා විකිණීමේ තනි අයිතිවාසිකම වර්ෂ 1924ක්වූ මැයි මස 30වෙනි සිකුරාදා පෙරවරු 10ට කෑගල්ලේ කච්චේරියේදී කෑගල්ලේ උප ඒජන්ත උන්නාන්සේ විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනවා ඇත.

වැඩිදුර කාරණා කෑගල්ලේ කච්චේරියෙන් දැනගත හැකිය.

වර්ෂ 1924ක්වූ අප්‍රේල් මස 30වෙනි දින කෑගල්ලේදීය.

ජේ. ආර්. වෝල්ටර්ස්,
උප ඒජන්ත උන්නාන්සේ වම්හ

| නො. | ගම. | කොටඨාසය. | මන්ඩිය. |
|---|---|---|---|
| 1 | උස්සාපිටිය .. | ගල්බොඩකෝරළේ .. | අස්මඩල, දිවල, උඩගන, පාවිටගම සහ උස්සාපිටිය |
| 2 | වැල්ගමුව .. | කිනිගොඩකෝරළේ .. | ගබ්බල, හේවාදිවෙල සහ වැලිගමුව |
| 3 | අම්බලන්පිටිය .. | කෝරළේතුන .. | අම්බලන්පිටිය සහ ගොඩගම්පොල |
| 4 | පෙලන්පිටිය .. | එම .. | පෙලන්පිටිය |

## සුප්‍රිම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙන මෙයින් ප්‍රකාශකරන්නේනම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනෙල් නඩුවිභාගය වර්ෂ 1924ක්වූ මැයි මස 21වෙනි දින පෙරවරු 11 පැය පටන් මීගමුවේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැම දෙනාටම දන්වන්නෙමි.

වර්ෂ 1924ක්වූ මැයි මස 3වෙනි දින කොළඹ පිස්කල් කන්තෝරුවේදීය.

ඩබ්ලිව්. ඩී. බැටර්ශිල්,
බ. දි. ද. පිස්කල් වම්හ.

A. C. RICHARDS, ACTING GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.